සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 07 - 2023

## බුද්ධ ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

සැලකිය යුතුය,

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 2 බැගින් හිමි වේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.

---

- අංක 01 සිට 05 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. බුදුරජාණන් වහන්සේ තම මංගල ධර්ම දේශනය සිදු කළේ,
    1. ආලාරකාලාම තවුසාටය. 2. පස්වග මහනුන්ටය.
    3. භග්ගව තවුසාටය. 4. උද්දිකරාමපුත්ත තවුසාටය.

02. උපතිස්ස කෝලිත පිරිවැජියන් දෙදෙනා සමඟ බුදු සසුනේ පැවිදි වූ පිරිස,
    1. 250 කි. 2. 1003 කි.
    3. 300 කි. 4. 500 කි.

3. බුදු සසුනේ අග්‍රදායකයා හා අග්‍රදායිකාව වන්නේ,
    1. අනේපිඩු සිටුතුමා හා සුජාතාවයි. 2. අනේපිඩු සිටුතුමා හා විශාඛාවයි
    3. බිම්බිසාර රජු හා විශාඛාවයි. 4. අනේපිඩු සිටුතුමා හා සුජාතාවයි.

4. බුදුරජාණන් වහන්සේ විසින් සිඟාලක ගෘහපතියාට දේශනා කළ සූත්‍රය වන්නේ,
    1. මහා නිදාන සූත්‍රයයි. 2. රතන සූත්‍රයයි.
    2. කරණීයමෙත්ත සූත්‍රයයි. 4. සිඟාලෝවාද සූත්‍රයයි.

5 ධම්ම සේනාපති තනතුරින් පිදුම් ලැබූ මහ රහතන් වන්නේ,
    1. සැරියුත් මහරහතන් වහන්සේ, 2. ආනන්ද මහරහතන් වහන්සේ,
    2. කාශ්‍යප මහරහතන් වහන්සේ, 4. මුගලන් මහරහතන් වහන්සේ,

- අංක 06 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර B තීරුවෙන් තෝරා එහි අංකය A තීරුවෙහි තිබෙන වරහනෙහි යොදන්න.

| A | | B |
|---|---|---|
| 06. දෙවියන්ට පුදන කොටස | ( ) | 1. ජේතවනාරාමය |
| 07. බිම්බිසාර රජු | ( ) | 2. අක්කියාල |
| 08. අලුත් බත් දානය | ( ) | 3. පූර්වාරාමය |
| 09. අනන්තලක්ඛණ සූත්‍රය | ( ) | 4. අග්‍රශෂ්‍ය දානය |
| 10. විශාඛා උපාසිකාව | ( ) | 5. පස්වග තවුසන් |



LIVEWORKSHEETS

• 11 සිට 15 දක්වා වූ ප්‍රශ්නවලට හරි නම් (√) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද යොදන්න.

11. බුදුරජාණන් වහන්සේ දෙවි මිනිසුන්ගේ ශාස්තෘ වූ හෙයින් සත්ථා දේවමනුස්සානන් වූ සේක. ( )
12. උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංග 5 කි. ( )
13 සිඟාලෝවාද සූත්‍රය තුන් සූත්‍රයට අයත් එකකි. ( )
14. වෛරය වෛරයෙන් නොසන්සිඳේ. ( )
15. උපයන ධනය සමාජ යුතුකම් වෙනුවෙන් වැය කළ යුතු බව දක්වා ඇත්තේ පත්තකම්බ සූත්‍රයෙ ය. ( )

• අංක 16 සිට 20 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

16. සෝවන් වූ පළමු රජතුමා............................................................ රජතුමාය.
17. ..................................................දී මහා සුළඟක් සමඟ වර්ෂාවක් ඇති වීම හා එම වර්ෂාවෙන් බුදු රදුන් ආරක්ෂා කිරීමට මුචලින්ද නා රජු ඉදිරිපත් විය.
18 මෛත්‍රිය වැඩිය යුතු ආකාරය මැනවින් විස්තර කෙරෙන දේශනාවකි .................................................. ය
19. අප බෝධි සත්වයන් වහන්සේ බුද්ධත්වයට පත් වූයේ ..............................................පෝය දිනයේදී ය.
20. උපතිස්ස කෝලිත ..........................................පිරිවැජියාගේ ගෝලයන් ය.

(සංජය/බිම්බිසාර/ වෙසක්/පොසොන්/හයවන සතිය/කරණීයමෙත්ත)



LIVEWORKSHEETS